## දෙවන වාර පරීක්ෂණය - 2020
## භූගෝල විද්‍යාව I - 13 ශ්‍රේණිය - පිළිතුරු පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | 5 | 11. | 4 | 21. | 3 | 31. | 1 |
| 2. | 3 | 12. | 2 | 22. | 4 | 32. | 2 |
| 3. | 4 | 13. | 3 | 23. | 2 | 33. | 4 |
| 4. | 1 | 14. | 5 | 24. | 5 | 34. | 3 |
| 5. | 4 | 15. | 4 | 25. | 1 | 35. | 5 |
| 6. | 5 | 16. | 1 | 26. | 2 | 36. | 4 |
| 7. | 5 | 17. | 4 | 27. | 4 | 37. | 1 |
| 8. | 1 | 18. | 5 | 28. | 3 | 38. | 1 |
| 9. | 5 | 19. | 3 | 29. | 5 | 39. | 3 |
| 10. | 4 | 20. | 2 | 30. | 5 | 40. | 2 |

(නිවැරදි පිළිතුරකට ලකුණු 1 බැගින් ලකුණු 40 යි)

### I - කොටස

**01).** i). පාසල, උප තැපැල් කාර්යාලය (ල.02) ii). ගං දඟරය, හැඩපලු ගංගාව (ල.02)

iii). ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මායිම (ල.02)

iv). අක්ෂාංශ හා දේශාංශ එකිනෙක කැපී යන ස්ථානයකි (ල.01)

v). a). පොල් වගාව (ල.01)


b). වී වගාව, ගෙවතු වගා, වෙනත් වැවිලි (ඉස්සන් කොටු) මින් දෙකක් නම් කිරීමට (ල.02)

vi). 6.4 Km (ල.02)

vii). වෙරළබඩ පහත් බිම් ප්‍රදේශයකි - ලවණ මිශ්‍ර වැලි පස නිසා පොල් වගාව බහුල ය - වැව් හා ගංගා ආශ්‍රිත ව වී වගාව - වෙරළබඩ වගුරු හා කඩොලාන ආශ්‍රිත ව ඉස්සන් කොටු දක්නට ලැබීම ආදී ගැලපෙන විස්තරයකට (ල.04)

viii). ප්‍රධාන මාර්ග, අප්‍රධාන මාර්ග, සෙසු මාර්ග, මංසන්ධි, පුළුල් ඒකීය දුම්රිය මාර්ග, පැතිරුණු මාර්ග ජාලය, ඉදිකල ප්‍රදේශ දක්නට ලැබීම, මාර්ග දෙපස රේඛීය ව විහිදුණු ජනාවාස රටාවක් දක්නට ලැබීම ආදී ලක්ෂණ ඇසුරෙන් ගැලපෙන විස්තරයකට (ල.04)

02). පිළිතුරු සඳහා සිතියම බලන්න



03). i). විමර්ශනය හෝ විශ්ලේෂණය හෝ සඳහා රැස්කල කරුණු හා සංඛ්‍යා, දත්ත ලෙස හැඳින්වේ. ගැලපෙන විස්තරයකට (ල.02)

ii). අප රැස්කර ගන්නා දත්ත ඒවායේ මූලික ස්වරූපයෙන් නැතහොත් කිසිදු ආකාරයකින් සංවිධානය නොකළ ඒවා අසමූහිත දත්ත ලෙස හැඳින්වේ. එහෙත් ඒ සෑම දත්තයකට ම අදාළ වටිනාකමක් ඇත. විභාගයක දී යම් විෂයයකට ළමයින් ලබාගත් ලකුණු වෙන් වෙන් ව දැක්වීම / අසමූහිත දත්ත ලෙස හඳුන්වනුයේ කිසි ම ආකාරයකට කාණ්ඩ නොකරන ලද සංඛ්‍යා සමූහයකි. එම දත්ත ඒවායේ ව්‍යාප්තිය පිළිබඳ ව කිසියම් අගයක් ලබා දීම සඳහා කාණ්ඩගත කළ විට ඒවා සමූහිත දත්ත වේ. විශාල දත්ත සංඛ්‍යාවක් පන්ති ප්‍රාන්තර අනුව සකස් කිරීම ආදී ගැලපෙන විස්තරයකට (ල.1½ බැගින් - ල.03)

iii). +සමීක්ෂණ - ප්‍රශ්නාවලි/සම්මුඛ සාකච්ඡා +නිරීක්ෂණ - ඍජු/සහභාගිත්ව +මිනුම් මේවායින් එක් ක්‍රමයක් විස්තර කිරීමට (ල.04)

iv). වාසි : දත්ත රැස් කිරීමේ කාලය අඩු ය, ශ්‍රමය, මුදල් වැයවීම අඩු ය, පහසුවෙන් ලබා ගත හැකිය, ඕනෑ ම අයෙකුට ලබා ගත හැකි වීම / අවාසි : දත්තවල නිරවද්‍යතාව, විශ්වසනීයත්වය පිළිබඳ ගැටලු, සමහර දත්ත ලබා ගැනීමට විශාල මුදලක් වැය වීම, පැරණි දත්ත නොමැති වීම හෝ සීමා සහිත වීම වාසි හා අවාසි තුනක් විස්තර විය යුතුය (ල.2 බැගින් - ල.06)

04). i). දුරස්ථ සංවේදය පිළිබඳ නිවැරදි නිර්වචනයකට ලකුණු දෙන්න (ල.02)

ii). A - භූ ස්ථාවර/ භූ සමකාලීන චන්ද්‍රිකා B - ධ්‍රැවක කක්ෂ චන්ද්‍රිකා (නම් කිරීමට ලකුණු 2 + එකක් විස්තර කිරීමට ලකුණු 2 - ල.04)

iii). භූමි පාදක වේදිකා / වාසර වේදිකා / අභ්‍යවකාශ වේදිකා (නම් කර විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ල.06)

iv). කාලගුණ හා දේශගුණ විද්‍යාව, සාගර විද්‍යාව, ග්ලැසියර් විද්‍යාව, හමුදා මෙහෙයුම් කටයුතු, භූ විද්‍යාව, කෘෂිකර්මාන්තය, වන විද්‍යාව, භූගෝල විද්‍යාව, ජල විද්‍යාව, භූ ලක්ෂණ හා සිතියම් විද්‍යාව, සැලසුම් කටයුතු, ස්වභාවික ආපදා කළමණාකරණය (ආදී ක්ෂේත්‍රයක භාවිතය විස්තර කිරීමට ලකුණු 03)

05). i). පරාසය, චාතුර්ථික, විසරණ සටහන්, මධ්‍යන්‍යය අපගමනය, සම්මත අපගමනය තුනක් නම් කිරීමට (ල.03)

ii). මධ්‍යන්‍යය = 14132/10 = **1413.2** (ල.02)


iii). මධ්‍යන්‍යය අපගමනය = 3048/10 = **304.8** (ල.04)

| වර්ෂය | භූමි ප්‍රමාණය (x) | $\bar{X}$ | $x - \bar{x}$ |
|---|---|---|---|
| 2009 | 1218 | 1413.2 | -195.2 |
| 2010 | 1683 | | 269.8 |
| 2011 | 1851 | | 437.8 |
| 2012 | 1832 | | 418.8 |
| 2013 | 1748 | | 334.8 |
| 2014 | 1293 | | -120.2 |
| 2015 | 1476 | | 62.8 |
| 2016 | 1060 | | -353.2 |
| 2017 | 944 | | -469.2 |
| 2018 | 1027 | | -386.2 |
| | | $\sum \lvert x-\bar{x}\rvert$ | **3048** |

$$MD = \frac{\sum |x - \bar{x}|}{n}$$


NMP - EXAM

iv). (ල.06)




06). i). දෛශික දත්ත ආකෘතිය / සිව්රුස් දත්ත ආකෘතිය (ල.02)

ii). ලක්ෂ්‍ය (Point), රේඛා (Line), කලාප/බහු අස්‍ර (Polygon) යන ලක්ෂණ දෛශික හා සිව්රුස් දත්ත ඇසුරෙන් නිරූපණය කරන ආකාරය රූප සටහන්, උදාහරණ භාවිතා කරමින් විස්තර කර තිබිය යුතුය (ලකුණ 2 බැගින් - ලකුණු 04)




දෛශික දත්ත ආකෘතිය

සිව්රුස දත්ත ආකෘතිය

iii). GIS ප්‍රයෝජන : සිතියමක් තුළ ඇති විවිධ තොරතුරු එක් එක් තේමා ඔස්සේ සිතියම් තල ලෙස (Data Layers) ගබඩා කරගැනීම හා නැවත ඒවා වෙන වෙන ම පරිශීලනය කරගැනීමට හැකි වීම / ත්‍රිමාණ සිතියම් ඇසුරෙන් තොරතුරු විශ්ලේෂණ කිරීමට හැකිවීම / අවකාශීය දත්ත පමණක් නොව අවකාශීය නොවන දතත් විශ්ලේෂණයට ඇති හැකියාව / කෙටි කාලයක දී භූගෝලීය දත්ත යාවත්කාලීන (Update) කිරීමේ හැකියාව / භූගෝලීය දත්තවල නිවැරදි පිහිටීම, පරිමාණය, වර්ගඵලය වැනි පරාමිතීන් ඉතා නිවැරදි ව ලබා ගැනීමට ඇති හැකියාව / පුද්ගල බද්ධ දෝෂ අවම වීම / විශාල සිතියම් ප්‍රමාණයක් ගබඩා කිරීම, පරිහරණය, ගෙනයාම වැනි කටයුතු ඉතා පහසුවෙන් කළ හැකි වීම / බහු විෂයානුබද්ධ ප්‍රවේශය ආදී ප්‍රයෝජන දෙකක් විස්තර කිරීමට (ල.2 බැගින් - ල.04)

iv). වනජීවී කළමණාකරණය / පාරිසරික අධ්‍යයන / ව්‍යාපාරික ක්ෂේත්‍රය / නාගරික අධ්‍යයන / පහසුකම් කළමණාකරණය / සෞඛ්‍ය ක්ෂේත්‍රය / ස්වාභාවික සම්පත් කළමණාකරණය
(වැනි ක්ෂේත්‍ර දෙකක් නම් කිරීමට ලකුණු 2 + එකක් විස්තර කිරීමට ලකුණු 3 - ල.05)

**භූගෝල විද්‍යාව II කොටස – පිළිතුරු පත්‍රය**

**<u>I කොටස - භෞතික භූගෝල විද්‍යාව - පිළිතුරු</u>**

**01).**

**I. A:** වෙළඳ සුළං **B:** බටහිර සුළං **C:** ධ්‍රැව/නැගෙනහිර සුළං **(ල.3)**

**II.** Af - නිවර්තන තෙත් / Am -නිවර්තන මෝසම් / Aw -නිවර්තන තෙත් හා වියළි (සැවානා)
(12 ගු.මා.දේ.ස. 79-80 පිටු) **වර්ග තුන නම් කිරීමට ලකුණු 3 + එකක් විස්තර කිරීමට ලකුණු 2 (ල.5)**

**III.** රැකියා - කෘෂිකර්මය - ආහාර පුරුදු - නිවාස - ඇඳුම් පැළඳුම් - ක්‍රීඩා හා විනෝදාස්වාදන කටයුතු
**ආදී කරුණු තුනක් විස්තර කිරීමට ලකුණු 2 බැගින් (ල.6)**

**IV.** **<u>ප්‍රවාහන ක්ෂේත්‍රය -</u>** වාහන දුම් පරීක්ෂාව, කාබන් බද්ද, ඉලෙක්ට්‍රික් හා දෙමුහුන් වාහන සඳහා සහන ලබා දීම, පොදු ප්‍රවාහන ක්‍රම ශක්තිමත් හා වැඩි දියුණු කිරීම, දුම්රිය ප්‍රවාහනය දිරිමත් කිරීම
**<u>බලශක්ති ක්ෂේත්‍රය -</u>** ජීව වායු භාවිතය, පුනර්ජනනීය බලශක්ති භාවිතයට දිරි ගැන්වීම, පුනර්ජනනීය බලශක්ති තාක්ෂණ දිරිමත් කිරීම - සුළං හා සූර්ය බලාගාර ඉදිකිරීම - හරිතාගාර වායු අඩුවෙන් පිටකරන බලශත්කි වර්ග හඳුන්වාදීම (ක්ෂෙත්‍ර දෙකෙන් එක බැගින් වත් තිබිය යුතුය) **විස්තර කිරීමට ලකුණු 2 බැගින් (ල.6)**

**02).**

**I.** අපසාරී තැටි මායිම් - අභිසාරී තැටි මායිම් - තීර්යයක් තැටි මායිම් **(ල.3)**

**II. A:** ඉන්දු-ඕස්ට්‍රේලියා තැටිය **/ B:** අප්‍රිකානු තැටිය **/ C:** උතුරු ඇමරිකානු තැටිය
**තැටි තුන නම් කිරීමට ලකුණු 3 + රටවල් නම් කිරීමට ලකුණු 3 (ල.6)**

**III.** සමමිතික නැම්ම / අසමමිතික නැම්ම / උළැගි නැම්ම / ඔත් නැම්ම / ඒකානති නැම්ම / සමානති නැම්ම / උඩු නැම් හා යටි නැම් මණ්ඩල
**මින් නැම් වර්ග තුනක රූප සටහන් නිවැරදිව ඇඳ විස්තර කිරීමට ලකුණු 2 බැගින් (ල.6)**

**IV.** සුනාමි ඇතිවීම/නායයෑම්/හිමකඳු කඩා වැටීම/කබොල බිඳී යාම/ජීවිත හානි/දේපළ හානි/ජල සම්පත්වල ස්වරූපය විකෘති වීම **ආදී කරුණු තුනක් නම් කිරීමට ලකුණු 3 + එකක් විස්තර කිරීමට ලකුණු 2 (ල.5)**

**03).**

**I.** නායයෑම් පිළිබඳ ගැලපෙන නිවැරදි අර්ථ දැක්වීමකට ලකුණු ලබා දෙන්න **(ල.3)**

**II. A:** ප්‍රපතනය Rock Fall / **B:** ගැලීම් Debris Flow / **C:** ලිහිටුම් Slump / **D:** රූරාව Creep
**නම් කිරීමට ලකුණු 1 බැගින් (ල.4)**

**III.** **<u>ඇතිවන ප්‍රදේශ -</u>** ජනාවාස පිහිටා ඇති බෑවුම්/අතීතයේ නායයෑමට ලක්වූ ප්‍රදේශ/කුඩා දියපහරවල් සහිත කඳු බෑවුම් ප්‍රදේශ/ස්වභාවික ආනතිය වැඩි කරන ලද බෑවුම්/වෙන්වුණු ගල් කුට්ටි සහිත පාෂාණ වලින් යුත් ප්‍රදේශ/අධික ලෙස කුස්තුර සහිත වූ පාෂාණ සහිත ප්‍රදේශ ආදිය
**<u>පූර්ව ලක්ෂණ</u>** - ක්ෂණික ජල උල්පත් මතුවීම/මඩ සහිත ජලය ගලා යාම/ජල උල්පත් හදිසියේ සිඳී යාම/ගස්, කණු, විදුලි කණු ආදිය ඇලවීම/නිවෙස්වල බිත්ති පුපුරායාම හෝ ගෙබිම ගිලා බැසීම/පොළව ගිලා බැසීම/සතුන්ගේ විවිධ අසාමාන්‍ය හැසිරීම් රටා ආදිය
**ඇතිවන ප්‍රදේශ නම් කිරීමට ලකුණු 3 + පූර්ව ලක්ෂණ දැක්වීමට ලකුණු 3 (ල.6)**

**IV.** **<u>භෞතික සාධක</u>** - වර්ෂාපතන තීව්‍රතාව/බෑවුමේ ස්වභාවය/භූ ව්‍යුහය/භූ කම්පන/පාෂාණ ජීර්ණය/භූගත ජලය/හිමවල බලපෑම ආදිය
**<u>මානුෂ සාධක</u>** - අක්‍රමවත් භූමි පරිහරණය/බෑවුම් ප්‍රදේශවල වන විනාශය/පිපිරීම් නිසා ඇතිවන කම්පන/අනවසර පතල් කැණීම/උස් බිම්වල ජලය රඳවා තැබීම/ස්වභාවික ජල මාර්ග අවහිර කිරීම/බෑවුම් ප්‍රදේශවල සිදුකරන අවිධිමත් ඉදිකිරීම් ආදිය
(සාධක දෙකෙන් එක බැගින් වත් තිබිය යුතුය) **විස්තර කිරීමට ලකුණු 2 බැගින් (ල.6)**

**04).**

**I.** ස්වාභාවික ක්‍රියාවලි හේතුවෙන් ප්‍රජාවට හෝ දේපළවලට හා පරිසරයට හානියක් සිදුවිය හැකි සංසිද්ධීන් උපද්‍රවයක් වන අතර, මිනිස් ජීවිත, දේපළවලට හා පරිසරයට හානි සිදුවන අයුරින් සක්‍රීය වීම උපද්‍රවයකි. **(ල.3)**

**II.** a). භූ විද්‍යාත්මක උපද්‍රව - D,E / දේශගුණ විද්‍යාත්මක උපද්‍රව - B,C / ජීව විද්‍යාත්මක උපද්‍රව - A, E

**ලකුණු ½ බැගින් (ල.6)**

b). තෙත් කලාපයේ - ජලගැලීම්, නායයෑම් / වියළි කලාපයේ - නියඟ

**III.** සාගර පත්ලේ සිදුවන භූමිකම්පා / සාගර පත්ලේ ගිනිකඳු පිපිරීමෙන් / සාගරය මතට උල්කාපාත කඩා වැටීමෙන් **නම් කිරීමට ලකුණු 3 + එකක් පැහැදිලි කිරීමට 3 (ල.6)**

**IV.** අක්‍රමවත් ඉඩම් පරිහරණය, අවිධිමත් ඉදිකිරීම්, කාර්මීකරණය, වනහරණය

**ක්ෂේත්‍රවලට අයත් වන ගැලපෙන කරුණු තුනක් විස්තර කිරීමට ලකුණු 2 බැගින් (ල.6)**

## II කොටස - මානුෂ භූගෝල විද්‍යාව - පිළිතුරු

**05).**

**I.** අඩු ම - උතුරු පළාත / වැඩිම - බස්නාහිර පළාත **(ල.2)**

**II.** නාගරීකරණය/කර්මාන්ත සඳහා එළිකිරීම/වගා බිම් සඳහා එළි කිරීම/මහාමාර්ග, නිවාස ආදී යටිතල පහසුකම් සංවර්ධන සඳහා/ජලාශ හා වෙනත් සංවර්ධන යෝජනා සඳහා/දැව ලබා ගැනීමට අනවසර වන විනාශය/මැණික්, මැටි, වැලි වැනි ඛනිජ ලබා ගැනීමට

**ආදී සාධක තුනක් විස්තර කිරීමට ලකුණු 2 බැගින් (ල.6)**

**III.** අනිවාර්ය අධ්‍යාපනය/නොමිලේ වෛද්‍ය පහසුකම්/ළමා, මාතෘ, වැඩිහිටි සායන පැවැත්වීම/සෞඛ්‍ය අධ්‍යාපනය/බාල වයස් ශ්‍රමිකයන් සම්බන්ධ නීති/නොමිලේ උසස් හා වෘත්තීය අධ්‍යාපන පහසුකම් සැපයීම/ පාසල්වල පහසුකම් වැඩි දියුණු කිරීම ආදිය **ආදී හේතු තුනක් පැහැදිලි කිරීමට ලකුණු 2 බැගින් (ල.6)**

**IV.** ශ්‍රම බලකායෙන් වැඩි ප්‍රතිශතයක් කාන්තාවන් වීම/ අවිවාහක කාන්තාවන් බහුල වීම/දේශපාලන හා පරිපාලන කටයුතු වල දී ගැටලුවලට මුහුණ පෑම/සමහර රැකියා වල කාන්තා නියෝජනය වැඩිවීම(ගුරු වෘත්තිය වැනි)/සියලුම රැකියාවල සම සමව කාන්තා නියෝජනය/ගෘහණියක් පමණක් නොව අනිකුත් සියලුම කටයුතුවල නිරතවීමට සිදුවීම **ආදී කරුණු තුනක් විස්තර කිරීමට ලකුණු 2 බැගින් (ල.6)**

**06).**

**I.** පෘථිවියේ තැන්පත්ව ඇති ඛනිජ ද්‍රව්‍ය කැණීම් මගින් මතුපිටට ගැනීමේ ක්‍රියාවලියයි.

**ගැලපෙන නිවැරදි පිළිතුරකට (ල.2)**

**II.** **<u>මතුපිට කැණීම -</u>** පොළොවේ නිධි වශයෙන් මතුපිට හෝ ඊට ආසන්නයේ හෝ බෑවුම්වල හෝ පවතින ඛනිජ ලබා ගැනීම උදා:- බොරළු, මැටි, වැලි, කබොක්, ගල් අඟුරු, කළුගල් ආදිය

**<u>භූගත කැණීම -</u>** පෘථිවි අභ්‍යන්තර කැණීම් මගින් ඛනිජ ද්‍රව්‍ය ලබා ගැනීම උදා:- යපස්, ගල් අඟුරු, රත්රන්, මිනිරන්, පෙට්‍රෝලියම් ආදිය

**කැණීම් වර්ග දෙක නම් කර, හඳුන්වා උදාහරණ දැක්වීමට ලකුණු 3 බැගින් (ල.6)**

**III.** **A:** චීනය / **B:** දකුණු අප්‍රිකාව / **C:** ඇ.එ.ජ. / **D:** ඉන්දියාව / **E:** රුසියාව **(ල.5)**

**IV.** මතුපිට පස් තට්ටු සෝදාගෙන යාම/පොළව මතුපිට ගිලා බැසීම/ගංගා ජලාශ ආදියෙහි රොන් මඩ තැන්පත් වීම/සරු බිම් ප්‍රදේශ විනාශ වීම/විවිධ සෞඛ්‍ය ගැටළු පැන නැගීම ආදිය

**අහිතකර බලපෑම් තුනක් විස්තර කිරීමට ලකුණු 2 බැගින් (ල.6)**

**07).**

I. බස්නාහිර පළාත - කොළඹ / නැගෙනහිර පළාත - මඩකලපුව / උතුරු පළාත - මන්නාරම **(ල.3)**

II. a). ග්‍රාමීය නාගරික සංක්‍රමණ / නාගරික ප්‍රදේශවල ජන සංඛ්‍යා වර්ධනය / ග්‍රාමීය ප්‍රදේශ නාගරික පරිපාලන සීමා තුළට ඇතුල් කිරීම **ක්‍රම තුන නම් කිරීමට (ල.3)**

b). බොෂ්වොෂ් / චිපිටිස් / ටොකයිඩෝ / බ්ලූ බනානා / ගෝල්ඩන් බනානා / ග්‍රීන් බනානා

**මින් හතරක් නම් කිරීමට ලකුණු ½ බැගින් (ල.2)**

III. අධික ජන සංඛ්‍යා තදබදය, විරැකියාව, නිවාස හිගය, ප්‍රවාහන ගැටලු, ජල ගැටලු, නාගරික පරිසර දූෂණය, ඉඩම් හිගය, සමාජ අපචාර ක්‍රියා බහුල වීම, පැල්පත් හා මුඩුක්කු නිවාස වර්ධනය, ඝන අපද්‍රව්‍ය ගැටලු, විවිධාකාරයේ සමාජීය බෙදීම්, මල අපවහන ගැටලු ආදිය **ගැටලු තුනක් විස්තර කිරීමට ලකුණු 2 බැගින් (ල.6)**

IV. නාගරික යටිතල පහසුකම් සංවර්ධනය, නාගරික ප්‍රජාවගේ ජීවන මට්ටම ඉහළ දැමීම, නිවාස දස ලක්ෂයෙ හා 15 ලක්ෂයේ වැඩසටහන්, බස්නාහිර පළාත් මහා නාගරික කලාප සංවර්ධන වැඩසටහන, නාගරික අපරාධ/සමාජ විරෝධී ක්‍රියා වලක්වා ගැනීමේ වැඩසටහන්, බෝවන හා බෝ නොවන රෝග පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් ආදිය**පියවර තුනක් පැහැදිලි කිරීමට ලකුණු 2 බැගින් (ල.6)**

**08).**

I. මූලද්‍රව්‍ය එකක් හෝ කිහිපයක් හෝ සංයෝග ඕමෙන් ඝන හෝ ස්ඵටික ස්වරූපයෙන් නිර්මාණය වන්නාවූ ඛනිජ සම්පතක් වන්නේ ආර්ථික කටයුත්තක් සඳහා එය භාවිතයට ගැනීමෙන්ය.

**ගැලපෙන නිවැරදි පිළිතුරකට (ල.2)**

II. මිනිරන් / ඛනිජ වැලි / ඇපටයිට්

**ඛනිජ වර්ග තුන නම් කිරීමට ලකුණු 3 + නිවැරදි ප්‍රදේශයක් බැගින් නම් කිරීමට ලකුණු 3 (ල.6)**

III. දේශිය කර්මාන්ත සඳහා අමුද්‍රව්‍යයක් වීම/ආනයනය කරනු ලබන අමුද්‍රව්‍ය හා දේශීයව නිපදවන දේ මිශ්‍ර කරමින් ඇතැම් නිෂ්පාදන සිදු කිරීම/දේශීය පරිභෝජනයට යොදාගන්නා අතරම විදේශ විනිමය උපයන මාර්ගයක් ලෙස යොදා ගැනීම/කෙඔලින් හා සිලිකා වැලි වලින් දේශිය නිෂ්පාදන සිදු කිරීම ආදිය **කරුණු තුනක් විස්තර කිරීමට ලකුණු 2 බැගින් (ල.6)**

IV. පරිසර හිතකාමී ආකල්ප වර්ධනය කිරීම, පුරවැසි සංවිධානවල සක්‍රීය සහභාගිත්වය ලබා ගැනීම,අදාළ අණ පණත් බල ගැන්වීම හා ක්‍රියාත්මක කිරීම, දේශපාලන කැපවීම ආදිය

**ආදී ක්‍රියාමාර්ග තුනක් විස්තර කිරීමට ලකුණු 2 බැගින් (ල.6)**

NWP EXAM

